# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
### 2013 මැයි - අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය - **MACO E 1025**

### ජනමාධ්‍ය ඉතිහාසය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.          කාලය : පැය 03 යි.

---

01. මානවයාගේ පරිණාමයත් සමඟ සිදුවූ ජීවවිද්‍යාත්මක සහ සමාජවිද්‍යාත්මක වෙනස්වීම් ඔස්සේ මූලික මානව සන්නිවේදන ස්වභාවයන් ඉස්මතු වූ ආකාරය හඳුන්වා දෙන්න.

02. සමාජ - ආර්ථික මෙන්ම දේශපාලන හා සංස්කෘතික මතවාද ව්‍යාප්තියෙහි ලා මුද්‍රිත මාධ්‍ය සතු ශක්‍යතා, පුවත්පත පිළිබඳ දේශීය හා ලෝක සංනිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. '' 'හඬ' පිළිබඳව සිදුකළ භෞතික-විද්‍යාත්මක අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් ලෙස ගුවන්විදුලි මාධ්‍යය බිහිවිය.'' මේ පිළිබඳව ඇති ලෝක හා දේශීය සංදිස්ථාන දක්වන්න.

04. ''රූපවාහිනිය අනාගතයේදී ඔබගේ බුද්ධිමය පරිසංවාදය හෝ කලාත්මක පරිකල්පනය හෝ පුබුදුවාලීමට හේතු නොවේ.'' මෙම අදහස හා සමඟ වර්තමාන රූපවාහිනියේ ක්‍රියාකාරිත්වය කෙතරම් දුරට ගැළපේද? සංසන්දනයක් කරන්න.

05. ''මානව ජීවිතයේ සැඟවුන ඉසව් අපූර්ව ආකාරයෙන් නිරූපණය කිරීම සිනමාවේ එක් අරමුණක් පමණි.'' ලෝක සිනමා සම්ප්‍රදායන්ගේ නව ප්‍රවණතා ඇසුරෙන් ඉහත අදහස පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. ලාංකේය සිනමාවේ අන්තර්ගත හා ප්‍රකාශන 70 දශකයෙන් පසුව වෙනස්වන්නේ කෙසේද? විස්තර කරන්න.

07. 50 දශකයෙන් පසුව ඉස්මතුවන නව සන්නිවේදන තාක්ෂණ විධි හඳුන්වා, ලොව මේ වන විට ඇතිව තිබෙන නව මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ විවේචනයක් කරන්න.

08. ''ආසියාවේ රටවල් අතුරෙන් වැඩිම ජංගම දුරකථන භාවිතයක් අප සතු වුවද, එය ඵලදායි ලෙස භාවිත කිරීම පිළිබඳව ඉදිරිපත්ව තිබෙන අදහස් ප්‍රමාණවත් නොවේ.'' මේ සඳහා ඔබගේ යෝජනා සවිස්තරව ඉදිරිපත් කරන්න.

**********************************